ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකඃ 2477424, 2477423, 2477311
ෆැක්ස්ඃ 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියඃ www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2018 ජුනි 18 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2018 මැයි

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2018 මැයි මාසයේ දී 60.6 ක දර්ශක අගයක් වාර්තා කරමින්, 2018 අප්‍රේල් මාසයට සාපේක්ෂව දර්ශක අගයයන් 15.1 කින් ඉහළ යන ලදී. ඒ මඟින්, අප්‍රේල් මාසයේ දක්නට ලැබුනු සෘතුමය පහළ යෑමෙන් පසුව නිෂ්පාදන ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්ව ඇති බව පිළිබිඹු වේ. මේ සඳහා, විශේෂයෙන්ම රෙදිපිළි සහ නිමි ඇඳුම් අංශය සඳහා මැයි මාසය තුළ ඇතිවූ නව ඇණවුම් හි ඉහළ යාම මෙන්ම, අප්‍රේල් මාසය තුළ වැඩි නිවාඩු දින ප්‍රමාණයක් පැවැතීම හේතුවෙන් නිම කළ නොහැකි වූ ඇණවුම් හි නිෂ්පාදන කටයුතු කිරීම, නිෂ්පාදන ක්‍රියාකාරකම් හි ඇතිවූ ඉහළ යෑම සඳහා හේතු විය. නව ඇණවුම්, ගැනුම් තොග සහ සේවා නියුක්තිය යන උප දර්ශක ද මැයි මාසය තුළ ඉහළ යන ලදී. කෙසේ වුවද, රෙදිපිළි සහ නිමි ඇඳුම් අංශය සඳහා වන සේවා නියුක්ති උප දර්ශකය දර්ශක අගය වන 50.0 ට වඩා අඩු මට්ටමක පැවැතුණි. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප දර්ශකය, මැයි මාසයේ අවසන් භාගයේ පැවැති අයහපත් කාලගුණය හේතුවෙන් ආංශිකව ඉහළ යන ලදී. එසේ වුවද, ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සියලුම උප දර්ශක කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරමින්, 2018 මැයි මාසයේ දී සමස්ථයක් ලෙස නිෂ්පාදන ක්‍රියාකාරකම්හි වර්ධනයක් පිළිඹිබු කරන ලදී. තවද, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් ද යහපත් බව පෙන්නුම් කරයි.

- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2018 අප්‍රේල් මාසයේ දක්නට ලැබුණු අඩු ක්‍රියාකරකම් මට්ටමට සාපේක්ෂව මැයි මාසයේදී සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. මේ සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් හා සේවා නියුක්ති අංශවල සිදු වූ වර්ධනය හේතු විය. නව ව්‍යාපාර හා ව්‍යාපාර ක්‍රියාකාරකම්වල සිදු වූ වර්ධනය, විශේෂයෙන්ම මූල්‍ය, තොරතුරු සන්නිවේදන හා ප්‍රවාහන යන අංශවල දක්නට ලැබුණි. ප්‍රතිචාර දක්වන්නන් මෙම වර්ධනයට හේතු ලෙස සේවා සැපයුම් මාර්ග වැඩිදියුණු කිරීම හා තාක්ෂණික වැඩිදියුණු කිරීම හේතු ලෙස දක්වා තිබුණි. අප්‍රේල් මාසයේ සේවා නියුක්තියේ වාර්තා වූ පහළ යෑමට සාපේක්ෂව 2018 මැයි මාසයේ සේවා නියුක්තිය, වැඩි බඳවාගැනීම් හේතුවෙන් ඉහළ ගියේය. ඉදිරි මාස 3 සඳහා සේවා සපයන්නන්ගේ අපේක්ෂා මධ්‍යස්ථ ලෙස වර්ධනය වූ අතර නිම කිරීමට ඇති කාර්යයන් තවදුරටත් පහළ ගියේය. බදු ව්‍යුහයෙහි මෑත කාලීනව සිදු වූ සංශෝධන හා ප්‍රවාහන ගාස්තුවල සිදු වූ ඉහළ යෑම හේතුවෙන් සේවා අංශයේ අයකරන මිල ගණන් ඉහළ ගිය අතර, ඉදිරියේදී සිදු විය හැකි වැටුප් වර්ධන හේතුවෙන් සේවා අංශයේ අපේක්ෂිත ශ්‍රම පිරිවැය ද ඉහළ ගියේය.

| | ව\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 67.3 | 57.5 | 55.5 | 56.5 | 53.2 | 57.8 | 54.8 | 57.9 |
| | **2016** | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | 58.3 |
| | **2017** | 56.2 | 57.1 | 66.5 | 41.8 | 57.9 | 56.1 | 54.3 | 54.4 | 59.0 | 54.8 | 58.8 | 59.1 |
| | **2018** | 51.7 | 55.6 | 65.6 | 45.5 | **60.6** | - | - | - | - | - | - | - |
| සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 66.8 | 65.0 | 60.6 | 59.8 | 61.7 | 59.5 | 59.3 | 60.2 |
| | **2016** | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | 59.8 |
| | **2017** | 57.5 | 57.3 | 60.8 | 54.2 | 55.3 | 59.2 | 59.1 | 60.1 | 57.0 | 55.3 | 57.4 | 61.2 |
| | **2018** | 56.6 | 58.4 | 58.0 | 53.2 | **56.9** | - | - | - | - | - | - | - |

## නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




## සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය



තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.